## පළමුවන දේව ප්‍රකාශනය

ශෙපනියා 3:14-18

ශෙපනියා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

**(ඔබේ දෙවිඳාණෝ ඔබ ගැන ප්‍රිය මනාප වෙමින් ඔබට නව ජීවනයක් දෙන සේක.)**

සියොන් පුරගන, සොම්නසින් ගී ගයන්න; ජෙරුසෙලමේ වැසියෙනි, කෑමොර ගසන්න. ඉශ්‍රායෙල් ජනයෙනි ප්‍රීතිප්‍රමෝද වන්න. සමිඳාණෝ ඔබට විරුද්ධව තිබුණු නඩු තීන්දු අවලංගු කළ සේක; ඔබේ සතුරන් නෙරපා දැමූ සේක; ඉශ්රායෙල් හි රජ වන සමිඳාණෝ ඔබ සමග සිටින සේක. විපතට බිය වීමක් තවත් නැත. එදින ජෙරුසෙලම මෙසේ කියනු ඇත. "සියොන් නගරය, බිය නොවන්න. ඔබ අත දුබල වන්නට ඉඩ නාරින්න. ඔබේ දෙවි සමිඳාණෝ ඔබ සමග ය; ඔබට ජය අත්කර දෙන සෙබළාණෝ ය. එතුමාණෝ ඔබ ගැන ප්‍රිය මනාප වන සේක. සිය පෙමින් ඔබට නව ජීවනයක් දෙන සේක. ඔබ ගැන සොම්නස් සිතින් ගී ගයන සේක. මංගල දවසක් මෙන් ප්‍රීති වන සේක. ඔබ නින්දාව නොලබන පිණිස ඔබ අතර විනාශය පහ කරන සේක.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

යෙසායා 12:2-6

පිළිතුර: ඉශ්රායෙල් තුති ගී හඬ නගන්න. ශුද්ධ දෙවිඳාණෝ ඔබ අතර වන සේක.

ගීය: බලන්න, දෙවිඳාණෝ මාගේ ගැළවීම ය. මම එතුමාණන් කෙරෙහි විශ්වාසය තබමි; එතුමන් කෙරෙහි මට බියක් නැත. මන්ද, සමිඳාණෝ මාගේ ශක්තියත්, ගීතිකාවත් ය. එතුමාණෝ මාගේ ගැළවීම ය. ඔබ ගැළවීමේ ළිංවලින් ප්‍රීතියෙන් දිය ඇදගන්නහු ය.

ඒ දවසේ දී සෙනග මෙසේ පැසසුම් ගී යන්නෝ ය: "සමිඳුන්ට තුති පුදන්න; එතුමන්ගේ නම පවසා අයැදින්න. එතුමන්ගේ ක්‍රියා ජාතීන් අතර පවසන්න. එතුමන්ගේ නාමයේ ශ්‍රේෂ්ඨත්වය ප්‍රකාශ කරන්න.

"සමිඳුන් කළ අරුමපුදුම දේ නිසා පසස් ගී ගයන්න; මුළු ලොවට ම ඒ ගැන දන්වන්න. සියොන් වැසි සියල්ලෙනි, මොරගසා ගී ගයන්න; ඉශ්රායෙල් ශුද්ධ දෙවිඳාණන් උතුම් වන බැවින් ද සිය සෙනග අතරේ වැඩ සිටින බැවින් ද සතුටින් හඬ නගා ගී ගයන්න."

## දෙවන දේව ප්‍රකාශනය

පිලිප්පි 4:4-7

පාවුලු තුමන් විසින් පිලිප්පිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**("ස්වාමින් වහන්සේ විගස වඩින සේක.")**

සමිඳාණන් වහන්සේ තුළ නිතර ම ප්‍රීති වන්න. ප්‍රීති වන්නැ යි නැවතත් කියමි. ඔබගේ ගුණ යහපත්කම සියලු මනුෂ්‍යයන්ට දැනගන්නට ලැබේ වා. සමිඳාණන් වහන්සේ විගස වඩින සේක. ඔබ කිසිවක් ගැන කරදර නොවී, සියල්ලෙහි දී ස්තුති පූර්වක ව, යාච්ඤාවෙන් හා කන්නලව්වෙන් ඔබගේ අයැදීම් දෙවියන් වහන්සේට දන්වන්න. එවිට සියලු නැණනුවණ ඉක්මවා යන දෙවියන් වහන්සේගේ සාමදානය, ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළින් ඔබගේ සිතුම් පැතුම් ආරක්ෂා කරන්නේ ය.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

ලූක් 4:18

ආලේලූයා! ආලේලූයා!
"ස්වාමින් වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත්තේය. මක්නිසාද දිළිඳුන් හට සුබ ආරංචිය දේශනා කරනු වස්, උන්වහන්සේ මා ආලේප කළ සේක."
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ලූක් 3:10-18

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**(ඉතින් අප කළ යුත්තේ කුමක්ද?)**

එවිට ජනකාය, "එසේ නම් අප කුමක් කළ යුතු දැයි ජොහන්ගෙන් ඇසූහ." ඔහු උත්තර දෙමින් "අඳන දෙකක් ඇති අය නැති අයට දෙත්වා; කෑම ඇති අය කෑම නැති අයට දෙත්වා;" යි කීය. අයකැමියෝද බෞතිස්ම ස්නාපනය ලබන්නට අවුත්, "ගුරුදේවයිනි අප කුමක් කළ යුතුද" යි ඔහුගෙන් ඇසූහ. "නියමිත පමණට වැඩියෙන් අය බදු නොගන්නැ" යි ඔහු ඔවුන්ට කීය. භේවායෝද "ඉතින් අප කළ යුත්තේ කුමක්ද" යි ඇසූහ. "කිසිවෙකුගෙන් බලහත්කාරයෙන් වත් බොරු චෝදනා නැඟීමෙන්වත් කිසිවක් පැහැර නොගන්න. ඔබට ලැබෙන වැටුපෙන් සෑහී සිටින්නැ" යි ඔහු ඔවුන්ට කීය. මේ ක්‍රිස්තුවරයා වියහැකි දැයි සෙනග අපේක්ෂාවෙන් බලා සිටියදීත්, හැම දෙන ජොහන් ගැන විවාද කරමින් සිටිය දීත්, ජොහන් සියල්ලන්ට පිළිතුරු දෙමින්, "මම නම් ඔබ වතුරෙන් බව්තිස්ම ස්නාපනය කරමි. එහෙත් මට වඩා ආනුභාව සම්පන්න උතුමෙක් එන්නේය; එතුමන්ගේ පාවහන් පටි මුදන්නටවත් මම නොවටිමි; එතුමාණෝ ශුද්ධාත්මයාණන්ගෙන්ද, ගින්නෙන් ද, ඔබ බව්තිස්ම ස්නාපනය කරවන සේක. කමත හොඳ හැටි පිරිසිදු කරන පිණිසත් ධාන්‍ය පොළා සිය අටුවෙහි රැස් කරන පිණිසත්, උන්වහන්සේගේ අතෙහි කුල්ල ඇත; එහෙත් බොල් නොනිවෙන ගින්නෙන් දවනු ලැබේ ය"යි කීය. මෙසේ තවත් බොහෝ අනුශාසනා මගින් ඔහු සමූහයාට සුභ අස්න දේශනා කළේය.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.